**පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා තොගයේ වටිනාකම රු.1,175,828ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂ ගිණුම්වල ඇතුළත් කරන බව. | ගබඩා තොගය මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසියේ විකුණූ වර්ග 31ක අයිතමයන් 231ක පිරිවැය සහ නැති වූ පොත් 5,147ක පිරිවැය වත්කම්වලින් අඩුකර දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම්වල නිවැරදි කරන බව. | අපහරණය කළ හා නැති වූ වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් අඩුකර දැක්විය යුතුය. |
| (ඇ) | පුස්තකාල 11කට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.555,598 ක පොත් 1,316ක් සහ වටිනාකම සඳහන් නොවූ පොත් 1,435 ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග ලැබුණු පොත්වල වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව. | පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත්වල වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගතයුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.48,538,599ක ශේෂ 05කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | ලිඛිත සාක්ෂි ලැබී තිබූ වත්කම්, ලේඛනයේ ලේඛනගත කළ නමුත්, එහි තථ්‍ය වටිනාකම ලේඛනවල දැක්වීමට කටයුතු කරන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

### 1.6 අනුකූල නොවීම්

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන 03/2017(L) චක්‍රලේඛය සහ ලිපිය. | සභාවේ ජල සම්පාදන අංශයේ සේවය කරන සුපරීක්ෂකවරයෙකු සහ සේවකයින් 02ක් විසින් ඔවුන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කර නොතිබුණි. | එම සේවකයින්ට ප්‍රධාන කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,206,294ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,840,744 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i) | වරිපනම් හා බදු | 1,500,000 | - | - | - | 1,200,000 | - | - | - |
| ii) | කුලී | 3,049,700 | 2,280,751 | 1,390,200 | 890,551 | 1,930,000 | 888,000 | 764,850 | 436,152 |
| iii) | බලපත්‍ර ගාස්තු | 1,860,000 | 1,504,435 | 1,504,435 | - | 1,905,000 | 1,080,625 | 1,080,625 | - |
| iv) | වෙනත් ආදායම් | 7,375,000 | 11,925,773 | 10,019,913 | 1,905,860 | 19,865,000 | 45,333,421 | 42,381,478 | 2,969,842 |
| | | 13,784,700 | 15,710,959 | 12,914, 548 | 2,796,411 | 24,900,000 | 47,302,046 | 44,226, 953 | 3,405,994 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 අගෝස්තු 31 දිනැති අංක 1826 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාරව, ග්‍රාම සේවක වසම් 12ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස නම් කර ප්‍රකාශයට පත්කර තිබූ නමුත්, එම ප්‍රදේශවල පිහිටි දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට වර්ෂ 10කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | ගෞරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු අයකිරීමට කටයුතු කරන බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා පැවැති හිඟහිටි බදු කුලී රු.271,091ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගිය කාලයට අදාල හිඟ හිටි අයකර ගැනීමටත්, ඒවා නොගෙවන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් නියමිත බව. | හිඟ හිටි අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.11,622,690 ක් හා රු. 9,685,627 ක් විය. | 2024 වර්ෂයේ අයකරගනු ලබන බව. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවේකානන්දපුර ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ 2021 වර්ෂ යේ සභාව විසින් රු.460,000ක් වැය කර මිලදී ගත් සූර්ය බලශක්ති ප්ලේට්/තහඩු සහ එයට සම්බන්ධ බැටරි සහ අලිවැට ඉදිකිරීමට මිලදීගෙන තිබූ ද්‍රව්‍ය, සොරකම් කර තිබූ නමුත් මේ පිළිබඳව මුදල් රෙගුලිසි 101 සිට 110 දක්වා විධිවිධාන ප්‍රකාරව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සොරකම් කිරීම සම්බන්ධව පොලීසියේ පැමිණිලි කර ඇති අතර මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩුව හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂ 03කට අධික කාලයක් අක්‍රීයව පැවැති ට්‍රැක්ටරය සහ ජල බවුසරය අලුත්වැඩියා කර නැවත පරිහරණය කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ට්‍රැක්ටරය සඳහා **PSDG** අරමුදල් පහසුකම් ලැබූ පසුව අළුත්වැඩියා සිදු කරනු ලබන බව. | ට්‍රැක්ටරය සහ ජල බවුසරය අලුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමට වූ වාහන 20ක් පවරා ගැනීමට සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරිමටත් පියවර ගෙන නොතිබුණි. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට පියවර ගනු ලබන බව. | සභාව සතු වත්කම් නිරවුල් කරගත යුතුය. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා මිලදී ගත් රු.1,082,500 ක් වටිනා Multichopper සහ Rotatable strainer යන්ත්‍ර පසුගිය වර්ෂ 02 සිට භාවිතා කිරිමට පියවර ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට අලි වැට ඉදිකර ආරක්ෂාව සැලැසීමෙන් පසුව පොහොර සැකසීමේ ක්‍රියාකාරකම් සිදු කිරීමට නියමිත බව. | Multichopper සහ Rotatable strainer ආදි යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩල පුරප්පාඩු 16ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ඉහළ මට්ටමේ පරිපාලනයට දැනුම් දී තිබුණද මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සභාවේ සේවකයන් 06කට ලබා දී තිබූ ආපදා ණය සහ වෙනත් ණය රු.503,195ක් වර්ෂ 13ක සිට අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | තොරතුරු කිසිවක් නොමැති මෙම සේවකයින් පිළිබඳව සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා මාර්ගයෙන් නැගෙනහිර පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි කපා හැරීමට නියමිත බව. | හිඟ සේවක ණය අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ 08 වගන්තිය ප්‍රකාරව, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) කල් ඉකුත් වීමට මාස 03කට ප්‍රථම අළුත්කිරිමට ඉල්ලුම් කළ යුතු වුවත්, ආයතන 31ක බලපත්‍ර කල් ඉකුත්වී තිබූ නමුත් අළුත්කිරිමට පියවර ගෙන නොතිබුණි. | බලපත්‍ර අළුත්කිරිමටත්, කල් ඉකුත්වීමේදී දඩ ගාස්තු අය කරනු ලබන බවත් දැනුම් දී ඇති බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත්කිරිමට පියවර ගත යුතුය. |